# අපේ පාසල කොතරම් ගුණාත්මක ද?

# පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලිය

දෙවන මුද්‍රණය

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල
2017

# පටුන


ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් 01

අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගෙන් 02

අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශයෙහි අතිරේක ලේකම්ගෙන් 03

කළමනාකරණ හා ප්‍රමිති ඒකකයේ අධ්‍යක්ෂගෙන් 04

හැඳින්වීම 05

ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ හැඳින්වීම 07

ඇගයීම් ආකෘතිය 01 - ශිෂ්‍ය සාධනය 08-15

ඇගයීම් ආකෘතිය 02 - ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම 16-18

ඇගයීම් ආකෘතිය 03 - විධිමත් විෂයමාලා කළමනාකරණය 19-21

ඇගයීම් ආකෘතිය 04 - විෂය සමගාමී කටයුතු 22-24

ඇගයීම් ආකෘතිය 05 - ශිෂ්‍ය සුභසාධනය 25-27

ඇගයීම් ආකෘතිය 06 - නායකත්වය හා කළමනාකරණය 28-33

ඇගයීම් ආකෘතිය 07 - භෞතික සම්පත් කළමනාකරණය 34-36

ඇගයීම් ආකෘතිය 08 - පාසල හා ප්‍රජාව 37-39

ලකුණු පිරිනැමීම 40-42

ගුණාත්මක තහවුරුව සම්බන්ධ ප්‍රශ්න 43-45

චක්‍රලේඛය හා ඇමුණුම් 46-51

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන්

වත්මන් රජයේ මූලික අරමුණක් වනුයේ ශීඝ්‍ර ආර්ථික හා සමාජමය සංවර්ධනයක් සඳහා අවශ්‍ය වන දක්ෂතා සහ තාක්ෂණික නිපුණතා ලබා ගත හැකි අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමයි. අධ්‍යාපනය වෙනුවෙන් යම්කිසි රජයක් හෝ පුද්ගලයෙකු විසින් වැය කරන කාලය, ශ්‍රමය, ධනය එකී සමාජයට දිගුකාලීන ප්‍රතිඵල ලබා දෙන ආයෝජනයකි. ඕනෑම රටක සමාජයේ චර්යා රටාව, එම රටෙහි අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ මිනුම් දණ්ඩකි. ගුණාත්මක ජීවිතවලින් සමන්විත ගුණාත්මක සමාජයක් බිහිකළ හැක්කේ නිසි අධ්‍යාපන ක්‍රියාවලියක් තුළින් පමණි.

මෙම වැදගත් අරමුණ ඉටුකර ගැනීම සඳහා පාසල් පද්ධතියේ ගුණාත්මක සංවර්ධනය ඉලක්ක කරගත් අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලියක් අත්‍යාවශ්‍ය වේ. යම් ආයතනයක් හෝ සංවිධානයක් අපේක්ෂිත අරමුණු කරා ගමන් කරන්නේ ද යන්න නොකඩවා සොයා බලමින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා ඇගයීම අත්‍යාවශ්‍ය සාධකයකි. ඇගයීමක් නොමැති විට කළමනාකරණය බිඳ වැටේ.

ඇගයීම යන සංකල්පයෙහි වැදගත්කම හඳුනා ගනිමින් නව ප්‍රවණතා හා සැසඳෙන පරිදි ඇගයීම් ක්‍රමවේද යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව මත මෙම නව මාර්ගෝපදේශය හඳුන්වා දීමට කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව කටයුතු කර ඇත. පාසල් ඇගයීම තවදුරටත් ඉදිරියට ගෙන යමින් පාසල් සුපරීක්ෂණ ක්‍රමය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ස්ථාපනය කිරීම රජයේ අපේක්ෂාවයි.

පුළුල් වශයෙන් වෙනස් වන සමාජ පරිසරය තුළ අපේක්ෂිත ඉලක්ක කරා පාසලේ කටයුතු යොමු වන්නේ දැයි සොයා බැලීම සහ ඒ සඳහා පාසල සතු සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට යොමු කරන්නේද යන ප්‍රධාන අපේක්ෂා සාක්ෂාත් කර ගැනීම පිණිස මෙම නව ඇගයීම් මාර්ගෝපදේශය පද්ධතියට හඳුන්වා දිමට අදහස් කර ඇත.

පාසල තුළ ඇගයීම් කටයුතු සිදු කිරීමේදී මෙම මාර්ගෝපදේශය මඟින් හඳුන්වා දී ඇති ඇගයීම් උපකරණ නම්‍යශීලීව හා නිර්මාණාත්මකව උපයෝගී කර ගනිමින්, පාසලේ පවතින ප්‍රබලතා මෙන්ම දුබලතා කෙරෙහිද සංවේදී වෙමින් පාසල දැනට පවතින තත්ත්වයෙන් ඉහළට ඔසවා තැබීම සඳහා පාසල් ඇතුළු සියලුම අධ්‍යාපනික ආයතනවල ක්‍රියාකාරී දායකත්වය අපේක්ෂා කරමි.

අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය

අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගෙන්

රටක සංවර්ධන ක්‍රියාවලියේ පදනම වනුයේ ගුණාත්මක බවින් යුතු අධ්‍යාපන ක්‍රමයකි. අධ්‍යාපන පද්ධතියේ සමස්ත ක්‍රියාවලියේම ප්‍රමුඛ අරමුණ වනුයේ සිසුන්ට ගුණාත්මක බවින් යුතු ඉහළ සේවාවක් සැපයීමයි.

පාසල්වල පවතින සීමිත සම්පත් උපරිම අයුරින් යොදා ගැනීම මෙන්ම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පාසලේ ඇති භෞතික හා මානව සම්පත් උපරිම අයුරින් භාවිත කිරීමද අත්‍යවශ්‍ය වේ.

පාසලෙහි ඇගයීම් ක්‍රියාත්මක කිරීමෙහි අරමුණ වනුයේ ඉහත කාර්යයන් ඉටුවේද යන්න පිළිබඳ සොයා බැලීමයි. එහිදී සියලුම පාසල්වල විවිධතා නොසලකා පොදු ප්‍රමිති, නිර්ණායක හා දර්ශක පදනම් කරගත් ස්වයං ඇගයීම් ක්‍රමවේදයක් මෙන්ම පාසලට සම්බන්ධ බාහිර පාර්ශව විසින් සිදු කරන බාහිර ඇගයීම් ක්‍රමවේදය ද අත්‍යවශ්‍ය වේ. එලෙස ක්‍රියාත්මක කරන සවිමත් හා විශ්වාසනීය ඇගයීම් ක්‍රියාවලියක් මගින් සමස්ත පාසල් පද්ධතිය ගුණාත්මක බවින් ඉහළ තත්ත්වයකට පත් කළ හැකිය.

පාසලෙහි අභ්‍යන්තර ඇගයීම් අඛණ්ඩ ව සිදු කිරීම මෙන් ම සෑම අභ්‍යන්තර ඇගයීමකින් පසුව පාසලේ විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලය විසින් පාසලේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ සමාලෝචනයක යෙදී තම ශක්තීන් මෙන් ම සංවර්ධන අවශ්‍යතා සාමූහික ව හඳුනා ගැනීම වැදගත් වේ. එහිදී ශක්තීන් ඇගයීමටත් හඳුනාගත් සංවර්ධන අවශ්‍යතා සඳහා පිළියම් යෙදීමටත් අවකාශය ලැබේ. ජාතික, පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමෙන් සිදු කරන බාහිර ඇගයීම්වල නිර්දේශවලින් ද පාසල සංවර්ධනය කරා ගෙන යාමට මනා දායකත්වයක් සපයයි.

පාසල් පද්ධතියෙහි ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව විසින් සකස් කරන ලද මෙම "පාසල් පද්ධතියේ ගුණාත්මක තහවුරුව සඳහා ඇගයීම් ක්‍රියාවලිය" පොත සකස් කිරීමට දායකත්වය දැක්වූ පාසල්, කොට්ඨාස, කලාප, පළාත් හා ජාතික මට්ටමේ සැමට මාගේ ස්තූතිය පිරිනමමි.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්

ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්ය සාධන සමාලෝචන අංශයෙහි අතිරේක ලේකම්ගෙන්

පාසල් පද්ධතියෙහි ගුණාත්මකබව තහවුරු කිරීම මගින් එහි නිමැවුම වන ශිෂ්‍ය ප්‍රජාව ඉහළ ගුණාත්මක බවින් යුක්ත පිරිසක් බවට පත්කළ හැකිවේ. ඒ සඳහා පාසලෙහි අභ්‍යන්තර ප්‍රජාව විසින් පුළුල් දර්ශනයක් තුළ ක්‍රියාකාරී ලෙස ඒකරාශීව කාර්යක්ෂම කළමනාකරණ ක්‍රියාවලියක් දියත් කළ යුතු අතර තම ශක්තීන් හා පවත්නා ගැටලු පිළිබඳ සංවේදී වෙමින් අධ්‍යාපනයෙහි ගුණාත්මකබව තහවුරු කිරීමට කටයුතු කළ යුතුවේ.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා අභ්‍යන්තර ඇගයීම පාසලෙහි විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. ඇගයීම් උපකරණ කාර්යක්ෂමව භාවිත කිරීම සහ සරල ක්‍රමවේද භාවිතය මගින් ඵලදායී ඇගයීමක් ක්‍රියාත්මක කළ හැකි වේ. එමගින් වෙනස් වන සමාජ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පාසලේ කටයුතු දිශානුගත කිරීමට හැකි වීම, මානව හා භෞතික සම්පත්වල කාර්යක්ෂම භාවිතය, ගුරු සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ පාසල් ප්‍රජා සම්බන්ධතා වර්ධනයට මගපෙන්වීම වැනි වාසි රැසක් අත්කර ගත හැකි වේ. එසේම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායී බව සඳහා ද මෙම කරුණු ඉතා වැදගත් වේ.

පාසල තුළ ශක්තිමත් අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම මෙන් ම තම ශක්තීන් සහ සංවර්ධනය විය යුතු අංශ පිළිබඳ නිසි මගපෙන්වීමක් සිදු කරන බාහිර ඇගයීම් ක්‍රියාවලියක් ද අත්‍යවශ්‍ය වේ. පාසලට පරිබාහිර ආයතන විසින් විධිමත් ක්‍රමවේදයකට අනුව බාහිර ඇගයීම් සිදු කිරීම මගින් පාසල් පද්ධතියේ ගුණාත්මක සංවර්ධනය ළඟා කර ගැනීම වඩාත් පහසු වනු ඇත.

ඉහත සියලු අරමුණු පෙරදැරි කොට අධ්‍යාපන පද්ධතියෙහි කාලානුරූපීව සිදුවන වෙනස්කම්වලට අනුව මෙතෙක් පැවති ඇගයීම් ක්‍රමවේදය යම් යම් සංශෝධනයන්ට ලක් කර මෙම "පාසල් පද්ධතියේ ගුණාත්මක තහවුරුව සඳහා ඇගයීම් ක්‍රියාවලිය" සකස් කර ඇත. එය වඩාත් පහසු නිර්ණායක හා දර්ශක පාදක ඇගයීම් ක්‍රමවේදයක් බව මේ සම්බන්ධ ව සිදු කළ වැඩසටහන් මගින් අනාවරණය වී ඇත. මෙම ඇගයීම් ක්‍රමවේද භාවිතයෙන් සමස්ත අධ්‍යාපන පද්ධතියෙහි ම ගුණාත්මක තහවුරුව සඳහා කටයුතු කිරීම සියලු අධ්‍යාපන නිලධාරීන්ගේ වගකීම වේ.

එස්.යූ. විජේරත්න
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්ය සාධන සමාලෝචන)

කළමනාකරණ හා ප්‍රමිති ශාඛාවෙහි අධ්‍යක්ෂගෙන්

ගුණාත්මක අධ්‍යාපනයක් පිළිබඳ සිහිනය යථාර්ථයක් බවට පත්කර ගැනීම උදෙසා පාසල්වල කළමනාකරණ ක්‍රියාවලියේ ගුණාත්මක තත්ත්වය තහවුරු කිරීම අත්‍යාවශ්‍ය වේ. අධ්‍යාපන පද්ධතියට යෙදවුම් වශයෙන් යොමු කරන භෞතික හා මානව සම්පත් නිසි ප්‍රමිතියකින් යුතුව කළමනාකරණය කිරීමෙන් මෙම අභියෝගය ජයගත හැකි බව මාගේ විශ්වාසයයි.

මේ සඳහා අවශ්‍ය සම්පත් සපයාදීම මෙන්ම එම ආයතනවල සිදුවන කාර්යයන් පිළිබඳ නිරන්තර ඇගයීමක් සිදුකළ යුතු ය. ඇගයීම් ක්‍රියාවලියකින් පාසල් පද්ධතියෙහි ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීමට හා මනා කාර්යක්ෂමතාවකින් හා ඵලදායිතාවකින් යුත් පාසලක් ගොඩනගා ගැනීමට අවධානය යොමු කළ හැකිවේ.

2001 වර්ෂයේ සිට පාසල්වලට හඳුන්වා දුන් ඇගයීම් ක්‍රමවේදය කාලීන අවශ්‍යතා අනුව විවිධ සංශෝධනවලට ලක් වෙමින් පවතී. මේ වන විට පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක වන "පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය III ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය" යම් යම් සංශෝධනවලට ලක්ව 2015 වර්ෂයේ සිට මෙම නව ඇගයීම් මාර්ගෝපදේශය පාසල්වලට හඳුන්වාදීමට සැලසුම් කර ඇත.

මෙම නව ඇගයීම් මාර්ගෝපදේශයට අනුව ශිෂ්‍ය සාධනය, ඉගෙනුම - ඉගැන්වීම හා ඇගයීම, විෂයමාලා කළමනාකරණය, විෂය සමගාමී කටයුතු, ශිෂ්‍ය සුභසාධනය, නායකත්වය සහ කළමනාකරණය, භෞතික සම්පත් කළමනාකරණය, පාසල හා ප්‍රජාව යන ප්‍රධාන ක්ෂේත්‍ර 08 ක් යටතේ නිර්ණායක 60 ක් සහ දර්ශක 210 ක් හඳුනාගෙන ඇත.

ඉහත සඳහන් දර්ශක හා නිර්ණායකය මගින් ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක ඇගයීමක් පාසල්වල සිදු කරනු ලබන අතර, ගුණාත්මකභාවය තවදුරටත් තහවුරු කිරීම සඳහා විදුහල්පති සහ පාසලේ කාර්යය මණ්ඩලය විසින් සාකච්ඡා කළ යුතු කරුණු කිහිපයක් ද ඇතුළත් කර ඇත. එමෙන්ම අභ්‍යන්තර ඇගයීම් සිදු කිරීමෙන් අනාවරණය කර ගනු ලබන සංවර්ධනය විය යුතු කරුණු 05 ක් තෝරාගෙන ඊළඟ වර්ෂයේ සැලස්මට ඇතුළත් කළ යුතුය. මෙමඟින් පාසලේ අඛණ්ඩව ගුණාත්මක සංවර්ධනයක් අපේක්ෂා කෙරේ.

මෙම මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, පළාත් හා කලාප ප්‍රමිති සම්බන්ධීකරණ නිලධාරීන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ලබා දුන් සහය ඉතා ඉහළින් අගය කරමි.

එස්.එම්.එල්.කේ. සෙනෙවිරත්න
අධ්‍යාපන අධ්‍යක්ෂ (කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව)

# 1. හැඳින්වීම

අධ්‍යාපනය සඳහා ආයෝජනය කරන භෞතික හා මානව සම්පත් ප්‍රමාණය නිසි ප්‍රමිතියකින් යුක්ත ව කළමනාකරණය කිරීමෙන්, ඉහළ ඵලදායීතාවකින් හා කාර්යක්ෂමතාවකින් යුත් පාසල් පද්ධතියක් නිර්මාණය කළ හැකි ය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව ඉලක්ක කර ගත් ඵලදායි හා කාර්යක්ෂම කළමනාකරණ ක්‍රියාවලියක් මෙන් ම ශක්තිමත් හා අඛණ්ඩ ඇගයීම් ක්‍රමවේදයක් පාසල් පද්ධතිය තුළ ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. එහි දී පාසල්වල පවත්නා විවිධතාවලට ගැළපෙන පරිදි පොදු නිර්ණායක හා දර්ශක පදනම් කර ගත් ස්වයං ඇගයීමේ ක්‍රමවේදයක් මෙන් ම එම ස්වයං ඇගයීම වඩාත් ඵලදායී කර ගැනීම සඳහා මගපෙන්වන විධිමත් බාහිර ඇගයීම් ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ ඇගයීම් විකාශනය පිළිබඳ කරුණු සලකා බැලීමේ දී 1950 දශකයෙහි පමණ සිට අධ්‍යාපනික ආයතන විසින් පාසල්වල කණ්ඩායම් පරීක්ෂණ සිදු කරන ලදී. පාසල් පරීක්ෂණය පිළිබඳ පාසල් දැනුවත් කිරීමෙන් පසු ව මෙන්ම හදිසියේ කරන කණ්ඩායම් පරීක්ෂණ ද සිදු කෙරුණි. එහි දී පාසලක පවත්වා ගෙන යනු ලබන ලේඛන, වාර්තා හා ගුරු ඉගැන්වීම් පරීක්ෂා කිරීම් ආදිය නිලධාරීන් අතින් සිදු විය. එම අධීක්ෂණ යම්කිසි ආකාරයකට ඉහළ ස්තර මගින් සිදුකරන ක්‍රියාවලියක් වීමත් යම් ආඥාදායක ස්වරූපයක් දැරීමත් නිසා ඒ පිළිබඳව පාසල්වල සහ විශේෂයෙන් ගුරුවරුන් අතර පැහැදීමක් නොවීය. එසේම පුද්ගල බද්ධතා හා බලපෑම් ද දක්නට ලැබිණි. බොහෝ විට "අධීක්ෂණය හුදෙක් අඩු පාඩු සෙවීම සඳහාය" යන ආකල්පය ගුරුවරුන් හා පාසල් පරිපාලනය තුළ ඇති විය. මේ අනුව අධ්‍යාපන පරමාර්ථ පිළිබඳව අවබෝධයක් ඇති කරලීම සහ කාලානුරූපීව සිදු වූ වෙනස්කම්වලට සාපේක්ෂව සාධාරණ සහ අපක්ෂපාතී ක්‍රමවේදයක් ගොඩනැගිය යුතු විය. එම නිසා පොදුවේ සාක්ෂ්‍ය පදනම් කරගත් ඇගයීම් ක්‍රමවේදයන්හි අවශ්‍යතාව මතු වූ අතර වැරදි සෙවීමෙන් බැහැරව පාසල් ශක්තිමත් කිරීම සඳහා සහය වීමේ අවශ්‍යතාවක් ගොඩනැගුණි.

එමෙන් ම 1980 දශකයෙන් පසු විවිධ රටවල පාසල් පද්ධතීන්හි දැකිය හැකි කළමනාකරණ ක්‍රියාවලියේ වෙනස් වීමේ විශේෂිත ලක්ෂණයක් ලෙස ඉහළ සිට පහළට සිදු කෙරෙන පාසල් කළමනාකරණය වෙනුවට පහළ සිට ඉහළට සිදු කෙරෙන කළමනාකරණ පිළිවෙත කෙරෙහි අවධානය යොමු වීම පෙන්වා දිය හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාසල් මට්ටමින් තීරණ ගැනීමේ හැකියාවත්, එම තීරණ ක්‍රියාත්මක කිරීමේ ස්වාධීනත්වයත් පාසල් කළමනාකරණයට ලැබිණි.

ඉහළ සිට පහළට සිදු කෙරෙන කළමනාකරණ ක්‍රියාවලියේ දී බාහිර උපදේශකවරුන් හා පරීක්ෂකවරුන් පාසල් වෙතට සිය දැනුම ගෙනවිත් එම දැනුම අනුසාරයෙන් පාසල කළමනාකරණය කිරීම සඳහා පාසල් පරිපාලනයට උපදෙස් දීම හා ඒ අනුව පරිපාලන කටයුතු කරන්නේ ද යන්න විමසිලිමත් ව සිටීම සිදු වේ. ඔවුන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු වන්නේ ප්‍රතිඵල කෙරෙහි මිස පවතින තත්ත්වය හෝ ඊට හේතු කාරක සාධක පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනයක් සඳහා නොවේ. එමෙන් ම බොහෝ විට ඇගයීමට ලක් කෙරුණේ ද පාසල් අධ්‍යාපනය සඳහා වූ ගුණාත්මක තත්ත්වයට වඩා ප්‍රමාණාත්මක තත්ත්වයයි. මෙම ක්‍රමය ප්‍රතික්ෂේප කළ රටවල් අධ්‍යාපන සංවර්ධනය සඳහා පහළ සිට ඉහළට කෙරෙන කළමනාකරණය කෙරෙහි විශ්වාසය තැබූ අතර බැහැරින් සිදු කෙරෙන අධීක්ෂණය වෙනුවට පාසල තුළ ම සිය කටයුතු සංවර්ධනය කර ගැනීම සඳහා ස්වයං ඇගයීම් ක්‍රමවේද භාවිතයට යොමු විය.

1990 දශකයෙහි පමණ සිට අධීක්ෂණයට වඩා ඇගයීම් ක්‍රියාවලියෙහි වැදගත්කම පිළිබඳ ව වැඩි අවධානයක් යොමු වූ අතර දැනුම ගොඩනැංවීම හා අත්පත් කර ගැනීම උදෙසා අධ්‍යාපනයේ ප්‍රාදේශීය පාලන ඒකක/ආයතන ඔවුන් වෙත පැවති තීරණ ගැනීමේ අයිතිය පාසලට ලබා දීමට සහ පාසල් සංවිධානය හැදෑරීමට අවශ්‍ය උපායමාර්ගික මෙවලමක් ලෙස ස්වයං ඇගයීම සංවර්ධනය කර ගැනීමට සහය විය. මෙය පාසල් සංවර්ධන ක්‍රියාදාමය පාසල විසින් ම ස්වයං විනිශ්චයට ලක් කිරීමක් වැනි ක්‍රමවේදයක් වේ. මේ සම්බන්ධ ව පර්යේෂකයන් පැහැදිලි කරන්නේ බාහිර උපදේශක මට්ටමින් පාසල් කළමනාකාරීත්වයට සෘජුව මැදිහත් වීමට වඩා සුසාධ්‍යකාරකයන් ලෙස කටයුතු කිරීම සුදුසු බවයි.

ශ්‍රී ලංකාවේ වත්මන් ඇගයීම් ක්‍රමවේදය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී 2001 වර්ෂයෙහි අධ්‍යාපන අමාත්‍යාංශයෙහි ඇගයීම් හා ප්‍රමිති ඒකකය පිහිටුවීම වැදගත් සංධිස්ථානයක් ලෙස හැඳින්විය හැකිය. 2004 වර්ෂයේ එම ඒකකය කළමනාකරණ හා ප්‍රමිති ඒකකය වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමත්, 2005 වර්ෂයේ පාසල් අභ්‍යන්තර ඇගයීම් පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහය හා 2007 වර්ෂයේ අධ්‍යාපන ප්‍රමිති හා බාහිර ඇගයීම් මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීමත්, නිසා වර්තමාන ඇගයීම් ක්‍රියාවලියට සුබවාදී ප්‍රවේශයක් ඇති විය. 2009 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ප්‍රමිති මාර්ගෝපදේශය හඳුන්වා දීමෙන් පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සම්බන්ධ විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත. 2009 වර්ෂයේ මෙම නව ඇගයීම් හා නියාමන වැඩපිළිවෙළ (චක්‍රලේඛ අංක 2008/06) ඔස්සේ පාසල්වල ස්වයං ඇගයීම බලවත්ත කිරීමට කිසියම් සහයක් ලබා දී තිබේ. ඒ ඔස්සේ පාසල් අභ්‍යන්තර ඇගයීම් කමිටු පිහිටුවමින් පාසල් මට්ටමින් සරල අභ්‍යන්තර ඇගයීම් සැලැස්මක් සකස් කිරීම, පාසල් තත්ත්ව කව පිහිටුවීම, පන්ති කාමර නිරීක්ෂණය, ශිෂ්‍ය සාධන මට්ටම් විශ්ලේෂණය හා වාර්ෂික සමස්ත ඇගයීමක් මගින් පාසලේ ප්‍රබලතා හා ගැටලු හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශ සපයන ලදී.

මෙම ක්‍රමවේදය වසර කිහිපයක් තිස්සේ පාසල්වල ක්‍රියාත්මක වන අතර වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පාසල් අධ්‍යාපන ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ නව ඇගයීම් සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ කාලීන අවශ්‍යතාවක් මතුව ඇත. එහිදී තත්ත්ව සහතිකකරණය (Quality Assurance) සංකල්පය ඔස්සේ පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා නිර්ණායක මූලික ඇගයීම් ක්‍රමයක අවශ්‍යතාව ඇති වී ඇති හෙයින් ඒ අනුව ඇගයීම් සම්බන්ධ නව ප්‍රවණතා හා සැසඳෙන පරිදි පවත්නා ඇගයීම් ක්‍රමවේද යම් යම් සංශෝධනවලට ලක් කර ඇත. ඉහත අවශ්‍යතා අනුව සකස් කරන ලද මෙම අභ්‍යන්තර හා බාහිර ඇගයීම් මාර්ගෝපදේශය 2015 වර්ෂයෙහි සිට පාසල්වලට හඳුන්වා දීම මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි ඇගයීම් සම්බන්ධ නව සංස්කෘතියක් ඇති කිරීම සඳහා මගපෙන්වීමක් සිදු කිරීමට අපේක්ෂිතය. එම කාර්යය සඳහා සකස් කරන ලද නව ප්‍රමිතීන්, ඇගයීම් නිර්ණායක හා දර්ශක මගින් පාසල්වල ශක්තිමත් ස්වයං ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත්, බාහිර පාර්ශවයන් විසින් පාසල ඇගයීමට ලක්කරමින් ඒවා විශිෂ්ටත්වය කරා ප්‍රවේශ කරවීමට අවශ්‍ය මගපෙන්වීම ලබා දීමටත් බලාපොරොත්තු වේ.

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකබව කෙරෙහි තවදුරටත් සංවේදී වෙමින් මෙම මාර්ගෝපදේශයෙහි ඇතුලත් ඇගයීම් තේමා හා නිර්ණායක පදනම් කර ගත් පාසල් ගුණාත්මක විගණනයක් සඳහා පාසල් සුපරීක්ෂණ ක්‍රමවේදයක් 2017 වසරේ දී හඳුන්වා දීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු යොදා තිබේ.

## 2. ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ හැඳින්වීම



දර්ශක හා නිර්ණායක පදනම් ව සිදු කෙරුණු පාසල ඇගයීමේ ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කරමින් නව ඇගයීම් වැඩපිළිවෙළ ඇගයීම් ක්ෂේත්‍ර 8ක් යටතේ ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රමිති, එම ප්‍රමිතීන්ට ළඟා වීම සඳහා අවශ්‍යතා, නිර්ණායක හා දර්ශක මෙන්ම සෑම ඇගයීම් ක්ෂේත්‍රයක්ම අවසානයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ සාකච්ඡා කළ යුතු ප්‍රශ්න මෙම මාර්ගෝපදේශයේ අන්තර්ගත වේ. ඒවායෙහි සාරාංශයක් පහත වගුවෙන් දක්වා ඇත.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වූ නව ඇගයීම් වැඩපිළිවෙළ

| අනු අංක | ඇගයීම් ක්ෂේත්‍ර | ප්‍රමිති | ප්‍රමිතියට ළඟා වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා | නිර්ණායක | දර්ශක | ගුණාත්මක තත්ත්වය තහවුරු කිරීම සඳහා ප්‍රශ්න |
|---|---|---|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 02 | 03 | 05 | 35 | 05 |
| 2 | ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම | 02 | 05 | 04 | 30 | 07 |
| 3 | විධිමත් විෂයමාලා කළමනාකරණය | 01 | 03 | 08 | 25 | 05 |
| 4 | විෂය සමගාමී කටයුතු | 01 | 03 | 05 | 14 | 04 |
| 5 | ශිෂ්‍ය සුභසාධනය | 01 | 04 | 09 | 22 | 04 |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 01 | 07 | 16 | 45 | 07 |
| 7 | භෞතික සම්පත් කළමනාකරණය | 01 | 02 | 08 | 26 | 04 |
| 8 | පාසල හා ප්‍රජාව | 01 | 03 | 05 | 13 | 04 |
|  | මුළු ගණන | 10 | 30 | 60 | 210 | 40 |

# 1. ශිෂ්‍ය සාධනය

## ප්‍රමිති

- නිපුණතා අත්පත් කර ගැනීම සඳහා විධිමත් තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියක් පවත්වා ගනියි.
- ඵලදායී ප්‍රතිපෝෂණ මගින් ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළ නංවයි.

## අවශ්‍යතා

- ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරුකරණය මගින් නිපුණතා ළඟා කර ගත් බව තහවුරු කරයි.
- ද්විතීයික ශ්‍රේණිවල සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම් මගින් ශිෂ්‍ය සාධන මට්ටම් තහවුරු කරයි.
- දත්ත විශ්ලේෂණය තුළින් ලබා ගන්නා අනාවරණ මත ඵලදායී ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යයි.

## නිර්ණායක

- විෂයමාලා අරමුණු වලට ළඟා වීම.
- ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල අත්පත් කර ගැනීම.
- වාර පරීක්ෂණ ලකුණු වල ප්‍රගතිය මැන බැලීම.
- පාසල් පදනම් කරගත් ඇගයීම්වල ප්‍රගතිය මැන බැලීම.
- සාධන මට්ටම් විශ්ලේෂණය කිරීම.



ඇගයීම් ආකෘතිය 01- A

## ශිෂ්‍ය සාධනය

## 1.1 ප්‍රාථමික අංශය

පාසලේ නම........................................................

ඒ ඒ මට්ටමට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය අනුව පහත සඳහන් ලෙස ලකුණු ලබාදෙන්න.

| | | |
|---|---|---|
| ශිෂ්‍ය ප්‍රතිශතය 90% හා ඊට ඉහළ | - විශිෂ්ටයි | (ලකුණු 06) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 75% - 89% | - ඉතා හොඳයි | (ලකුණු 05) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 60% - 74% | - හොඳයි | (ලකුණු 04) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 45% - 59% | - සාමාන්‍යයි | (ලකුණු 03) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 25% - 44% | - සංවර්ධනය විය යුතුයි | (ලකුණු 02) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 25% ට අඩු | - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි | (ලකුණු 01) |

1.1.1 විෂයමාලා අරමුණුවලට ළඟා වීම (ප්‍රාථමික) - (වගුව 1.1.1)

| | දර්ශකය | මුළු සිසුන් ගණන | ඒ ඒ නිපුණතා මට්ටම්වලට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|---|
| 1.1.1.1 | පළමු ප්‍රධාන අවධිය සඳහා අදාළ නිපුණතා 40 ට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
| 1.1.1.2 | දෙවන ප්‍රධාන අවධිය සඳහා අදාළ නිපුණතා 52 ට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
| 1.1.1.3 | තුන්වන ප්‍රධාන අවධිය සඳහා අදාළ නිපුණතා 55 ට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | |

1.1.2 ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල අත්පත් කර ගැනීම - (වගුව 1.1.2)

| | දර්ශකය | විභාගයට පෙනී සිටි මුළු සිසුන් ගණන | ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|---|
| 1.1.2.1 | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේදී ලකුණු 70 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | |

| ඇගයීම් කළ දර්ශක සංඛ්‍යාව | ඇගයීම් කළ දර්ශකවලට අනුව ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | ලබාගත් ලකුණු සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| | | | |

ඇගයුම්කරුගේ නම ........................................................................... අත්සන .............................................

දිනය ..............................................

| | |
|---|---|
| 01. විෂය මාලාවේ අරමුණුවලට ළඟා වීම (ප්‍රාථමික)<br><br>(වගුව 1.1.1) | <u>ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය සාධනය ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ උපදෙස්</u><br><br>එක් එක් අවධි අවසානයෙහි සකස් කරන නිපුණතා වාර්තා අනුව දර්ශක 1.1.1.1, 1.1.1.2 හා 1.1.1.3 සඳහා ලකුණු පිරිනැමිය යුතු වේ.<br><br>ඇගයීම් සිදුකරන දිනට පෙර වර්ෂයේ තක්සේරු වාර්තා මෙහිදී සැලකිල්ලට ගත යුතු වේ.<br><br>ඒ ඒ අවධිය සඳහා අදාළ නිපුණතා සියල්ලටම ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය<br><br>$= \frac{\text{ඒ ඒ අවධිය අවසානයේ දී අදාළ නිපුණතා අත්පත් කරගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව}}{\text{අදාළ ශ්‍රේණියේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව}} \times 100$<br><br>උදාහරණය -<br><br>පාසලක 2014 වර්ෂය අවසානයෙහි 2 ශ්‍රේණියේ ශිෂ්‍යයින්ගෙන් පළමු ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය ගණනය කිරීම.<br><br>2 ශ්‍රේණියෙහි සමාන්තර පන්තිවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 150 කි. මේ අතරින් පළමු ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා 40ට ළඟා වූ ශිෂ්‍ය සංඛ්‍යාව 120 කි.<br><br>ඒ අනුව පළමු ප්‍රධාන අවධියට අදාළ නිපුණතා 40 ට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය<br>$= \frac{120}{150} \times 100 = 80\ \%$ |
| වගුව 1.1.2 | ඇගයීම් සිදුකරන දිනට පාසලට ලැබී ඇති අවසාන ප්‍රතිඵල ලේඛනය අනුව ලකුණු පිරිනැමිය යුතුය. |

ඇගයීම් ආකෘතිය 01 - B

## ශිෂ්‍ය සාධනය

## 1.2 ද්විතීයික අංශය

පාසලේ නම........................................................

ඒ ඒ මට්ටමට ළඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය අනුව පහත සඳහන් ලෙස ලකුණු ලබාදෙන්න.

| | | |
|---|---|---|
| ශිෂ්‍ය ප්‍රතිශතය 90% හා ඊට ඉහළ | - විශිෂ්ටයි | (ලකුණු 06) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 75% - 89% | - ඉතා හොඳයි | (ලකුණු 05) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 60% - 74% | - හොඳයි | (ලකුණු 04) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 45% - 59% | - සාමාන්‍යයි | (ලකුණු 03) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 25% - 44% | - සංවර්ධනය විය යුතුය | (ලකුණු 02) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 25% ට අඩු | - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි | (ලකුණු 01) |

1.2.1 ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල - වගුව 1.2.1

| | දර්ශක | ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|
| 1.2.1.1 | අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් උසස් පෙළ විභාගයට සුදුසුකම් ලැබීම | | |
| 1.2.1.2 | අ.පො.ස. (උ. පෙ.) විභාගයේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම (කලා විෂය ධාරාව) | | |
| 1.2.1.3 | අ.පො.ස. (උ. පෙ.) විභාගයේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම (වාණිජ්‍යය විෂය ධාරාව) | | |
| 1.2.1.4 | අ.පො.ස. (උ. පෙ.) විභාගයේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම (විද්‍යා විෂය ධාරාව) | | |
| 1.2.1.5 | අ.පො.ස. (උ. පෙ.) විභාගයේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම (ගණිත විෂය ධාරාව) | | |
| 1.2.1.6 | අ.පො.ස. (උ. පෙ.) විභාගයේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම (තාක්ෂණ විෂය ධාරාව) | | |

1.2.2 වාර පරීක්ෂණ ලකුණුවල ප්‍රගතිය මැන බැලීම

(විෂයයන් සංඛ්‍යාව වැඩිවේ නම් ඒ අනුව වගුව සකස් කරගන්න)

6-11 ශ්‍රේණිවල ඒ ඒ විෂයන්ට ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය - වගුව 1.2.2.1

<table>
<tr><th rowspan="2"></th><th rowspan="2">විෂය</th><th colspan="6">ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය</th><th rowspan="2" colspan="2">සාමාන්‍ය ප්‍රතිශතය</th><th rowspan="2">ලකුණු</th></tr>
<tr><th>6</th><th>7</th><th>8</th><th>9</th><th>10</th><th>11</th></tr>
<tr><td>1.2.2.1</td><td>මව්බස</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td colspan="2"></td><td></td></tr>
<tr><td>1.2.2.2</td><td>ගණිතය</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td colspan="2"></td><td></td></tr>
<tr><td>1.2.2.3</td><td>විද්‍යාව</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td colspan="2"></td><td></td></tr>
<tr><td>1.2.2.4</td><td>ඉංග්‍රීසි</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td colspan="2"></td><td></td></tr>
<tr><td>1.2.2.5</td><td>ඉතිහාසය</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td colspan="2"></td><td></td></tr>
<tr><td>1.2.2.6</td><td>ආගම</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td colspan="2"></td><td></td></tr>
<tr><td rowspan="3">1.2.2.7</td><td>6-9 ශ්‍රේණිවල අනෙකුත් විෂයයන්</td><td colspan="6"></td><td>සාමාන්‍ය ප්‍රතිශතය</td><td>මධ්‍ය ප්‍රතිශතය</td><td></td></tr>
<tr><td>භූගෝල විද්‍යාව</td><td></td><td></td><td></td><td></td><td rowspan="2" colspan="2"></td><td></td><td rowspan="2"></td><td></td></tr>
<tr><td>ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය</td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
</table>

| | විෂය | ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | සාමාන්‍ය ප්‍රතිශතය | | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 6 | 7 | 8 | 9 | 10 | 11 | සාමාන්‍ය ප්‍රතිශතය | මධ්‍ය ප්‍රතිශතය | |
| | දෙවන බස (සිංහල/ දෙමළ) | | | | | | | | | |
| | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | | | | | | | | | |
| | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | | | | | | | | | |
| 1.2.2.8 | සෞන්දර්යය විෂයයන් | | | | | | | | | |
| | චිත්‍ර | | | | | | | | | |
| | නැටුම් | | | | | | | | | |
| | සංගීතය | | | | | | | | | |
| | නාට්‍ය හා රංග කලාව | | | | | | | | | |
| | සිංහල/ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය | | | | | | | | | |
| 1.2.2.9 | පළමු කාණ්ඩ විෂයයන් | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| 1.2.2.10 | තෙවන කාණ්ඩ විෂයයන් | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

12 -13 ශ්‍රේණිවල ඒ ඒ විෂයන්ට අදාළ ව සියලුම විෂයන්වලට ලකුණු 40 ට වඩා ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය - වගුව 1.2.2.2

| | විෂය ධාරාව | 12 ශ්‍රේණියේ ප්‍රතිශතය | 13 ශ්‍රේණියේ ප්‍රතිශතය | සාමාන්‍ය ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|---|---|
| 1.2.2.11 | කලා | | | | |
| 1.2.2.12 | වාණිජ්‍යය | | | | |
| 1.2.2.13 | විද්‍යා | | | | |
| 1.2.2.14 | ගණිත | | | | |
| 1.2.2.15 | තාක්ෂණ | | | | |

1.2.3 පාසල් පදනම් කරගත් ඇගයීම්වල ප්‍රගතිය මැන බැලීම

| | | |
|---|---|---|
| ශිෂ්‍ය ප්‍රතිශතය 90% හා ඊට ඉහළ | - විශිෂ්ටයි | (ලකුණු06) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 75% - 89% | - ඉතා හොඳයි | (ලකුණු05) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 60% - 74% | - හොඳයි | (ලකුණු04) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 45% - 59% | - සාමාන්‍යයි | (ලකුණු03) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 25% - 44% | - සංවර්ධනය විය යුතුයි | (ලකුණු02) |
| ශිෂ්‍ය ප්‍රතිශතය 25% ට අඩු | - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි | (ලකුණු01) |

වාරයට අදාළ ඇගයීම් නිම කළ පන්ති ප්‍රතිශතය - වගුව 1.2.3

| | | මුළු පන්ති සංඛ්‍යාව | අදාළ ශ්‍රේණිවල ඇගයීම් සම්පූර්ණයෙන් ම අවසන් කර ඇති පන්ති සංඛ්‍යාව | ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|---|---|
| 1.2.3.1 | 6-9 ශ්‍රේණි | | | | |
| 1.2.3.2 | 10-11 ශ්‍රේණි | | | | |
| 1.2.3.3 | 12-13 ශ්‍රේණි | | | | |
| | | | | | |

1.2.4 සාධන මට්ටම විශ්ලේෂණය කිරීම

ලකුණු ලබා දීම - එක් එක් දර්ශකයට අදාළ ව පවතින තත්ත්වය සලකා බලා පහත සඳහන් පරිමාණවලට අනුව ලකුණු පිරිනමන්න.

ලකුණු 06 - විශිෂ්ටයි
ලකුණු 05 - ඉතා හොඳයි
ලකුණු 04 - හොඳයි
ලකුණු 03 - සාමාන්‍යයි
ලකුණු 02 - සංවර්ධනය විය යුතුයි
ලකුණු 01 - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි

| නිර්ණායකය | දර්ශකය | | ලකුණු |
|---|---|---|---|
| පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහන අනුව සාධන මට්ටම විශ්ලේෂණය කිරීම හා වාර්තා තබා ගැනීම | 1.2.4.1 | 6-9 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, ලකුණු වාර්තා තබා ගැනීම, ලකුණු විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබීම. | |
| | 1.2.4.2 | 10 - 11 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, ලකුණු වාර්තා තබා ගැනීම, ලකුණු විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබීම. | |
| | 1.2.4.3 | 12 - 13 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, ලකුණු වාර්තා තබා ගැනීම, ලකුණු විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබීම. | |
| වාර විභාග අනුව සාධන මට්ටම විශ්ලේෂණය කිරීම හා වාර්තා තබා ගැනීම | 1.2.4.4 | සියලුම පන්තිවල වාර විභාග ලකුණු 'ලකුණු පොතට' ඇතුළත් කර තිබීම හා විදුහල්පති සහතික කර තිබීම. | |
| | 1.2.4.5 | 6 - 9 ශ්‍රේණිවල වාර විභාග ලකුණු විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර තිබීම. | |
| | 1.2.4.6 | 10 - 11 ශ්‍රේණිවල වාර විභාග ලකුණු විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර තිබීම. | |
| | 1.2.4.7 | 12 - 13 ශ්‍රේණිවල වාර විභාග ලකුණු විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර තිබීම. | |

| ඇගයීම් කළ දර්ශක සංඛ්‍යාව | ඇගයීම් කළ දර්ශකවලට අනුව ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | ලබාගත් ලකුණු සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| | | | |

ඇගයුම්කරුගේ නම ........................................................................ අත්සන ........................................

දිනය ......................................

ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල

වගුව 1.2.1

මෙම නිර්ණායක සඳහා ලකුණු පිරිනැමීමේ දී ඇගයීම් සිදු කරන දිනට පාසලට ලැබී ඇති ආසන්න ප්‍රතිඵල ලේඛනය අනුව ලකුණු පිරිනැමිය යුතුය.

උසස් පෙළ සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය ගණනය කිරීමේදී අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දී මව්බස හා ගණිතය ඇතුළුව සම්මාන 03 ක් සහිතව විෂයන් 06 කින් සමත් සංඛ්‍යාව සැලකිල්ලට ගත යුතුය.

---

වාර පරීක්ෂණවල ප්‍රගතිය මැන බැලීම

වගුව 1.2.2

මෙහිදී ඇගයීම් සිදු කරන දිනට ආසන්න වාරයෙහි පැවැත්වූ වාර පරීක්ෂණ ලකුණු පදනම් කරගනිමින් ඒ ඒ ශ්‍රේණිවල එක් එක් විෂය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙහි ප්‍රතිශතය ගණනය කළ යුතුය. ප්‍රතිශත ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයා සඳහන් කළ යුතුය.

උදාහරණය - 6 ශ්‍රේණියෙහි සමාන්තර පන්ති සියල්ලෙහිම ආගම විෂයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 100 ක් වන අතර එම විෂයට 40% ට වඩා ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 70 කි.

6 ශ්‍රේණියෙහි ආගම විෂයයට ලකුණු 40ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය $= \frac{70}{100} \times 100 = 70\%$

ඉහත ආකාරයට 6-11 ශ්‍රේණි සඳහා හර විෂයයන්හි ලකුණු 40 ට වඩා ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය ගණනය කර අදාළ ශ්‍රේණි සංඛ්‍යාවෙන් බෙදා ලැබෙන සාමාන්‍ය ප්‍රතිශත අගය අදාළ තීරුවේ සඳහන් කළ යුතුය. එම ප්‍රතිශත සඳහා නියමිත ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතුවේ.

උදාහරණය -

ආගම විෂයට ලකුණු 40 ට වඩා ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය පහත පරිදි වේ.

| පන්තිය | 6 | 7 | 8 | 9 | 10 | 11 | සාමාන්‍ය ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිශත | 70 | 80 | 90 | 60 | 75 | 85 | 77 | 5 |

ආගම විෂයෙහි ලකුණුවල සාමාන්‍ය ශිෂ්‍ය ප්‍රතිශතය ගණනය කිරීම

$$\frac{70\%+80\%+90\%+60\%+75\%+85\%}{6} = \frac{460}{6} = 76.6\,\% = 77\%$$

ඒ අනුව දර්ශකයට ලැබෙන ලකුණු සංඛ්‍යාව 5 කි.

දර්ශක 1.2.2.1 සිට 1.2.2.6 දක්වා විෂයයන් සඳහා ඉහත ආකාරයට සාමාන්‍ය අගයන් ගණනය කර අදාළ ලකුණු පිරිනැමිය යුතු වේ.

**6-9 ශ්‍රේණි අනෙකුත් විෂයයන්, සෞන්දර්ය විෂයන් හා 10-11 ශ්‍රේණි කාණ්ඩ විෂයන් සඳහා ලකුණු පිරිනැමීම.**

විෂය කාණ්ඩයක් එක් දර්ශකයක් වශයෙන් සැලකේ. මෙහිදී සෑම විෂයයක් සඳහා ම සාමාන්‍ය ප්‍රතිශත ගණනය කිරීමෙන් පසු මධ්‍ය ප්‍රතිශතය ද ගණනය කළ යුතුය. ලකුණු ලබා දිය යුත්තේ මධ්‍ය ප්‍රතිශතය අනුවය. සාමාන්‍ය ප්‍රතිශත අගයන් එකතුව විෂය සංඛ්‍යාවෙන් බෙදූ විට කාණ්ඩයට අදාළ මධ්‍ය ප්‍රතිශතය ලැබේ.

උදාහරණය -

පාසලක 10 හා 11 ශ්‍රේණිවල දෙවන කාණ්ඩයේ විෂයන් 3ක් සඳහා සියලු ම සමාන්තර පන්තිවල ලකුණු 40% ට වඩා ලබා ගත් ප්‍රතිශත පහත පරිදි වේ. ඒ අනුව සාමාන්‍ය ප්‍රතිශතය හා මධ්‍ය ප්‍රතිශතය ගණනය කර ඇත.

| විෂය | 10 ශ්‍රේණිය | 11 ශ්‍රේණිය | සාමාන්‍ය ප්‍රතිශතය | මධ්‍ය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ලකුණු ප්‍රතිශතය | ලකුණු ප්‍රතිශතය | | |
| A | 60% | 75% | 68% | $\frac{68\% + 48\% + 73\%}{3}$ = 63% |
| B | 40% | 55% | 48% | |
| C | 80% | 65% | 73% | |

ඉහත ආකාරයට 6-9 ශ්‍රේණිවල අනෙකුත් විෂයන්, සෞන්දර්යය විෂයන් හා කාණ්ඩ විෂයයන් සඳහා සාමාන්‍ය අගය ගණනය කර දර්ශක අංක 1.2.2.7 සිට 1.2.2.10 දක්වා ලකුණු පිරිනැමිය යුතු වේ.

වගුව 1.2.2.2

**12 - 13 ශ්‍රේණි සඳහා ලකුණු පිරිනැමීම.**

අදාළ විෂය ධාරාවේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සෑම විෂයකට ම ලකුණු 40 ට වඩා ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙහි ප්‍රතිශතය ගණනය කළ යුතු වේ.

උදාහරණය -
පාසලක 12 ශ්‍රේණියේ කලා විෂය ධාරාව හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 200 කි. හදාරන සෑම විෂයකට ම ලකුණු 40 ට වඩා ලබාගත් සිසුන් සංඛ්‍යාව 150 කි.

ඒ අනුව ශිෂ්‍ය ප්‍රතිශතය පහත සඳහන් පරිදි වේ.

$$= \frac{150}{200} \times 100\% = 75\ \%$$

12 හා 13 ශ්‍රේණි දෙකෙහිම ඉහත ආකාරයට ගණනය කර එම අගයන් එකතු කර 2 න් බෙදා ඒ ඒ විෂය ධාරාවෙහි සාමාන්‍ය අගය ගණනය කළ යුතු වේ.

පාසල පදනම් කර ගත් ඇගයීම් වල ප්‍රගතිය මැන බැලීම

වගුව 1.2.3

ඇගයීම් කරන දිනයට ආසන්නම වාරය තුළ සියලු ම විෂයන් සඳහා නියමිත පාසල පදනම් කරගත් ඇගයීම් ප්‍රමාණය සම්පූර්ණ කර ඇති පන්ති සංඛ්‍යාව මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

ඒ අනුව සියලුම විෂයන් සඳහා නියමිත පාසල පදනම් කරගත් ඇගයීම් නිමකර ඇති පන්ති ප්‍රතිශතය ගණනය කළ යුතුය.

උදාහරණය -
පාසලක 6-9 ශ්‍රේණිවල සියලු ම විෂයන් සඳහා 2014 දෙවන වාරයේ පාසල පදනම් කරගත් ඇගයීම් සම්පූර්ණයෙන් සිදුකර ඇති පන්ති සංඛ්‍යාව පහත දැක්වේ.

| **ශ්‍රේණිය** | **6** | **7** | **8** | **9** | **එකතුව** |
|---|---|---|---|---|---|
| සමාන්තර පන්ති සංඛ්‍යාව | 3 | 3 | 3 | 3 | 12 |
| සියලුම විෂයන් සඳහා පාසල පාදක ඇගයීම් සම්පූර්ණ කර ඇති පන්ති සංඛ්‍යාව | 1 | 2 | 2 | 3 | 8 |

දෙවන වාරයට නියමිත පාසල් පාදක ඇගයීම් නිම කර ඇති 6 - 9 ශ්‍රේණි පන්ති ප්‍රතිශතය

$$= \frac{08}{12} \text{ x } 100\% = 66.7\ \%$$

මෙලෙසම 6 - 9, 10 - 11 සහ 12 - 13 යන ශ්‍රේණිවල කාණ්ඩ විෂයන් සඳහා ඇගයීම් නිම කර ඇති පන්ති ප්‍රතිශත ගණනය කළ යුතුය.

# 2. ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම



### ප්‍රමිති

පුද්ගල හා සමාජ සංවර්ධනය ඉලක්ක කර ගත් විධිමත් හා සැලසුම් ගත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරනු ලබයි.

ශිෂ්‍යයින්ගේ ගුණාත්මක සංවර්ධනයට උපකාර වන විවිධ ඉගැන්වීම් මාධ්‍යවල උපකරණ හා ක්‍රියාකාරකම් භාවිත කරයි.

### අවශ්‍යතා

සැලසුම් සහගත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ඵලදායී ව ක්‍රියාත්මක කරයි.

අවස්ථෝචිත නවීකරණ මගින් ප්‍රිතිමත් හා ඵලදායී ඉගෙනුම් පරිසරයක් ඇති කරයි.

නිපුණතා සාක්ෂාත් කර ගැනීමට ශිෂ්‍යයින්ට සහාය වෙයි.

ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම් ක්‍රමවේද ක්‍රියාත්මක කරයි.

අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කරණය සඳහා විවිධ ඇගයීම් ක්‍රම භාවිත කරයි.

### නිර්ණායක

පාඩම සැලසුම් කිරීම හා පිවිසීම මැනවින් සිදුකර තිබීම.

පාඩම් සංවර්ධනය උසස් මට්ටමක පැවතීම.

ඇගයීම

පුද්ගල වගකීම් හා පෞරුෂය මනාව පිළිබිඹු කිරීම.

ඇගයීම් ආකෘතිය 02

## ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම (1 සිට 13 ශ්‍රේණි දක්වා)

පාසලේ නම - ..............................................................................................

මෙම ඇගයීම් ආකෘතිය ගුරුභවතුන් 04 දෙනෙකු ඇගයීමට භාවිත කරන්න

1. ගුරුභවතාගේ නම - .............................. විෂයය - ....................... ශ්‍රේණිය - .................... කාලච්ඡේදය - ................
2. ගුරුභවතාගේ නම - .............................. විෂයය - ....................... ශ්‍රේණිය - .................... කාලච්ඡේදය - ................
3. ගුරුභවතාගේ නම - .............................. විෂයය - ....................... ශ්‍රේණිය - .................... කාලච්ඡේදය - ................
4. ගුරුභවතාගේ නම - .............................. විෂයය - ....................... ශ්‍රේණිය - .................... කාලච්ඡේදය - ................

ලකුණු ලබා දීම - එක් එක් දර්ශකයට අදාළ ව පවතින තත්ත්වයන් සලකා බලා පහත සඳහන් පරිමාණවලට අනුව ලකුණු අදාළ කොටුවෙහි සටහන් කරන්න.

| | |
|---|---|
| ලකුණු 06 - විශිෂ්ටයි | ලකුණු 03 - සාමාන්‍යයි |
| ලකුණු 05 - ඉතා හොඳයි | ලකුණු 02 - සංවර්ධනය විය යුතුයි |
| ලකුණු 04 - හොඳයි | ලකුණු 01 - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි |

| නිර්ණායකය | දර්ශකය | | ලකුණු | | | |
|---|---|---|---|---|---|---|
| | | | ගුරු 01 | ගුරු 02 | ගුරු 03 | ගුරු 04 |
| 2.1 පාඩම සැලසුම් කිරීම හා පිවිසීම මැනවින් සිදුකර තිබීම | 2.1.1 | විෂය ප්‍රතිපත්ති, වාර/ සති/ දෛනික සටහන් සකස් කර අනුමත කරගෙන තිබීම | | | | |
| | 2.1.2 | සැලසුම්වල පාඩමට අදාළ අරමුණු හා නිපුණතා පැහැදිලිව දක්වා තිබීම | | | | |
| | 2.1.3 | විෂය අන්තර්ගතය නිවැරදි වීම හා ප්‍රමාණවත් වීම | | | | |
| | 2.1.4 | සිසුන්ගේ විවිධත්ව හා ඉගෙනුම් රටා පිළිබඳ අවධානය යොමු කරමින් විවිධ ඉගෙනුම් ක්‍රම හා උපාය මාර්ග ඇතුළත් කර තිබීම | | | | |
| | 2.1.5 | උචිත ඉගෙනුම් ආධාරක හා ප්‍රබෝධාත්මක ඉගෙනුම් අවස්ථා පිළිබඳව අවධානය යොමු කර තිබීම | | | | |
| | 2.1.6 | ප්‍රිය ජනක ඉගෙනුම් පරිසරයක් තිබීම හා ඉගෙනුම් ඉගැන්වීම් සම්පත් පන්ති කාමරයේ ප්‍රදර්ශනය වීම | | | | |
| | 2.1.7 | සැබෑ ජීවිත අත්දැකීම් ලබා ගත හැකි ඉගෙනුම් අවස්ථා පිළිබඳ අවධානය යොමු කර තිබීම | | | | |
| | 2.1.8 | ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සුදානම් කර තිබීම | | | | |
| | 2.1.9 | සිත් ඇදගන්නා ලෙස පාඩම ආරම්භ කිරීම | | | | |
| 2.2 පාඩම් සංවර්ධනය උසස් මට්ටමක පැවතීම | 2.2.1 | සැලැස්මට අනුව පියවරෙන් පියවර පාඩම ඉදිරියට ගෙන යාම | | | | |
| | 2.2.2 | පෙළපොතට අමතරව පාඩමට ගැළපෙන ලෙස පැවරුම්/ ක්‍රියාකාරකම්/ සම්පත් සහ ඉගෙනුම් ආධාරක ඵලදායී ලෙස උපරිමයෙන් යෙදවීම | | | | |
| | 2.2.3 | තර්කානුකූලව කටයුතු කිරීමට සිසුන් පෙළඹවීම/ යොමු කිරීම හා ප්‍රශ්න ඇසීම සඳහා සිසුන් ධෛර්යමත් කිරීම | | | | |
| | 2.2.4 | සිසුන්ගේ විවිධ දැනුම් මට්ටම්වලට ගැළපෙන ලෙස උදාහරණ, ඉලක්ක ගත ප්‍රශ්න හා පැවරුම් යොදා ගැනීම | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2.2.5 | නිසි පරිදි කාලය කළමනාකරණය කිරීම, ශිෂ්‍ය ක්‍රියාකාරී ඉගැන්වීම් රටාවක් අනුගමනය කරමින් හා සිසු ප්‍රතිචාර ලබා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම | | | | |
| | 2.2.6 | සිසු-සිසු හා සිසු-ගුරු අන්තර් සබඳතා ඇති වන පරිදි කණ්ඩායමක් ලෙස ඉගෙනීම සඳහා යොමු කිරීම | | | | |
| | 2.2.7 | විවිධ කුසලතා හා නිර්මාණශීලිත්වය වර්ධනය වන පරිදි ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම | | | | |
| | 2.2.8 | ස්වයං අධ්‍යයනයට යොමු කිරීම හා අවශ්‍ය සහය ලබා දීම | | | | |
| | 2.2.9 | සිසුන්ට සැබෑ ජීවිත අත්දැකීම් ලබාදෙන පරිදි පාඩම ගැළපීම | | | | |
| 2.3<br>ඇගයීම | 2.3.1 | අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථා ලබාදීම, අගය කිරීම හා නිවැරදි කිරීම | | | | |
| | 2.3.2 | පාඩම අවසානයේ දී ඉගැන්වූ දේ නැවත සාරාංශ කර සිසු අවබෝධය තහවුරු කිරීම | | | | |
| | 2.3.3 | සුදුසු ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේද භාවිත කිරීම හා ඒ තුළින් සිසුන්ගේ ශක්තීන් හා සංවර්ධනය විය යුතු අවස්ථා හඳුනා ගැනීම | | | | |
| | 2.3.4 | ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ සිදුකිරීම | | | | |
| 2.4<br>පුද්ගල වගකීම් හා පෞරුෂය මනාව පිළිබිඹු කිරීම* | 2.4.1 | සිසුන් සමග මෙන් ම අනෙකුත් කාර්ය මණ්ඩල සමග ද මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් පාසලේ වෙනත් කාර්යයන් සඳහා මනා දායකත්වයක් ලබා දීම | | | | |
| | 2.4.2 | නිවාඩු ලබා ගැනීම අවම වීම හා නිවාඩු ලබා ගැනීමේ දී පැවරුම්/ ක්‍රියාකාරකම් ලබා දී තිබීම | | | | |
| | 2.4.3 | නියමිත වේලාවට පාසලට, පන්තියට පැමිණීම හා පන්ති වාර්තා පොත්වල නිසි ලෙස සටහන් තැබීම | | | | |
| | 2.4.4 | මනා පෞරුෂයකින් සහ ආත්ම විශ්වාසයකින් යුක්ත වීම | | | | |
| | 2.4.5 | පාසල පදනම් කරගත් ඇගයීම්/ තක්සේරුකරණය නියමිත පරිදි සිදුකර තිබීම, විශ්ලේෂණ කිරීම හා ප්‍රතිකාර්ය වැඩසටහන් සිදු කිරීම | | | | |
| | 2.4.6 | නියමිත කාලය තුළ විෂය නිර්දේශයේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කිරීම | | | | |
| | 2.4.7 | අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම | | | | |
| | 2.4.8 | පුහුණු අවස්ථා සඳහා සහභාගි වීම හා වෘත්තීය දැනුම යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර තිබීම | | | | |
| මුළු ලකුණු | | | | | | |

* පුද්ගල වගකීම් හා පෞරුෂය නිර්ණායකයට අදාළව දර්ශකවලට ලකුණු දීමේ දී විදුහල්පති / කළමනාකරණ මණ්ඩලය සමග සාකච්ඡා කිරීම සහ අදාළ ලිපිගොනු / ලේඛන පරීක්ෂා කළ හැකිය.

| | ගුරු 01 | ගුරු 02 | ගුරු 03 | ගුරු 04 |
|---|---|---|---|---|
| ඇගයීම් කළ දර්ශක සංඛ්‍යාව | | | | |
| ඇගයීම් කළ දර්ශකවලට අනුව ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | | | | |
| ලබා ගත් ලකුණු සංඛ්‍යාව | | | | |
| ලකුණු ප්‍රතිශතය | | | | |

ඇගයුම්කරුගේ නම ................................................................ අත්සන ................................................

දිනය ................................

# 3. විධිමත් විෂයමාලා කළමනාකරණය

### ප්‍රමිති

ජාතික විෂයමාලාව තුළින් අපේක්ෂිත අරමුණු හා නිපුණතා සෑම ශිෂ්‍යයෙකුට ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගනියි.

### අවශ්‍යතා

ජාතික අරමුණු, පොදු නිපුණතා හා විෂය නිපුණතා සාක්ෂාත් වන පරිදි සැලසුම් සහගත ව විෂයමාලාව ක්‍රියාත්මක කරයි.

ශිෂ්‍ය නිපුණතා අත්පත් කර ගත හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරයි.

ඉගෙනුම් - ඉගැන්වීම් සංවර්ධනයට උපකාරී වන විවිධ ඉගෙනුම් මාධ්‍ය, උපකරණ, සම්පත් හා ක්‍රියාකාරකම් ඵලදායී ව යොදා ගනියි.

### නිර්ණායක

ජාතික අධ්‍යාපන අරමුණු / පොදු නිපුණතා ඉටු වන පරිදි විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීම.

ප්‍රාථමික අංශයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මැනවින් ක්‍රියාත්මක කිරීම.

අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා තක්සේරු ක්‍රියාවලිය විධිමත් ව සිදු කිරීම.

ඉගෙනුම් පරිසරයක් සඳහා භෞතික සම්පත් ඵලදායී ව යොදා ගැනීම.

විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට උපරිම පහසුකම් සැපයීම

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, විෂය නිර්දේශ සහ පෙළපොත් විධිමත් ව බෙදා හැරීම හා ඵලදායී භාවිතය

පන්ති වාර්තා පොත් මැනවින් පවත්වා ගැනීම.

ශිෂ්‍ය නිපුණතා සංවර්ධනයට අදාළ ව්‍යාපෘති



ඇගයීම් ආකෘතිය 03

## විධිමත් විෂයමාලා කළමනාකරණය

පාසලේ නම..................................................................

ලකුණු ලබා දීම - එක් එක් දර්ශකයට අදාළ ව පවතින තත්ත්වයන් සලකා බලා පහත සඳහන් පරිමාණවලට අනුව ලකුණු පිරිනමන්න.

ලකුණු 06 - විශිෂ්ටයි

ලකුණු 05 - ඉතා හොඳයි

ලකුණු 04 - හොඳයි

ලකුණු 03 - සාමාන්‍යයි

ලකුණු 02 - සංවර්ධනය විය යුතුයි

ලකුණු 01 - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි

| නිර්ණායකය | දර්ශකය | ලකුණු |
|---|---|---|
| 3.1. ජාතික අධ්‍යාපන අරමුණු / මූලික නිපුණතා ඉටුවන පරිදි විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීම | 3.1.1 ජාතික අධ්‍යාපන අරමුණු හා මූලික නිපුණතා ප්‍රදර්ශනය කර තිබීම හා ජාතික අධ්‍යාපන අරමුණු සහ මූලික නිපුණතාවල අපේක්ෂා පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කර තිබීම | |
| | 3.1.2 ජාතික අරමුණු සහ මූලික නිපුණතා සාක්ෂාත් වන පරිදි වාර්ෂික විෂයමාලා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 3.2 ප්‍රාථමික අංශයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මැනවින් ක්‍රියාත්මක කිරීම | 3.2.1 එක් අවධියක වගකීම එක ම ගුරුවරයෙකුට පවරා තිබීම හා ප්‍රගතිය නියාමනය කිරීම | |
| | 3.2.2 චක්‍රලේඛවලට අනුකූල ව පළමු, දෙවන හා තෙවන ප්‍රධාන අවධිවලට අදාළ ව සැලසුම් සහගත ක්‍රීඩා, සෙල්ලම් මිදුල, ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩ සිදු කිරීම හා උපරිම අන්දමින් භාවිතයට අවස්ථාව සැලසීම | |
| | 3.2.3 පූර්ව භාෂා හා පූර්ව ගණිත සංකල්ප තහවුරු කිරීමට කටයුතු කිරීම හා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, දෙමළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 3.3 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා තක්සේරු ක්‍රියාවලිය විධිමත් ව සිදු කිරීම | 3.3.1 පළමු වන හා තුන්වන ශ්‍රේණිවලට ඇතුළත් වන සිසුන් හඳුනා ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක වීම හා එක් එක් ශිෂ්‍යයා සම්බන්ධව යාවත්කාලීන වූ ලිපි ගොනු, සටහන් හා වාර්තා තබා ගැනීම | |
| | 3.3.2 සිසුන් හඳුනා ගැනීමේ වැඩසටහනේ අනාවරණ තුළින් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම | |
| | 3.3.3 තක්සේරු වාර්තා විශ්ලේෂණය කර අනාවරණ මත ප්‍රතිපෝෂණ වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර තිබීම | |
| | 3.3.4 එක් අවධියක අත්‍යවශ්‍ය නිපුණතා තොරතුරු ඊළඟ අවධියට ලබා දීම පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳ නියාමන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 3.4 ඉගෙනුම් පරිසරයක් සඳහා භෞතික සම්පත් ඵලදායී ව යොදා ගැනීම | 3.4.1 විවිධ විෂයන්වලට අදාළ වූ තොරතුරු ඇතුළත් නිර්මාණ පුවරු/ බිත්ති පුවත්පත් යාවත්කාලීනව පවත්වාගෙන යාම | |
| | 3.4.2 පන්තිවල ඇති නිර්මාණ/ උපකරණ/ පැවරුම් සුරක්ෂිත ව තැබීම හා යාවත්කාලීන වීම | |
| | 3.4.3 පන්තියේ විශේෂිත ස්ථාන සැලසුම් කර තිබීම, ඒවා භාවිතයට ගැනීම හා ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සම්පත් පහසුවෙන් ලබා ගැනීමේ හැකියාවක් තිබීම (වැඩ මේසය/ පොත් මුල්ල/ පන්ති පුස්තකාල........) | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |

| | | |
|---|---|---|
| 3.5 විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට උපරිම පහසුකම් සැපයීම | 3.5.1 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සියලු සිසුන් හඳුනා ගැනීම, එම සිසුන් සඳහා ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම | |
| | 3.5.2 අන්තර්කරණ අධ්‍යාපන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වේ නම් එම සිසුන්ට ද ගැළපෙන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කිරීම හා ප්‍රගති වාර්තා තබා ගැනීම | |
| | 3.5.3 විශේෂ අධ්‍යාපන ඒකකයක් ඇත්නම් එය සිසුන්ට ප්‍රවේශ පහසුකම් හා අවශ්‍ය සම්පත් සහිතව සිත් ඇදගන්නා අයුරින් නඩත්තු කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 3.6 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, විෂය නිර්දේශ සහ පෙළපොත් විධිමත් ව බෙදා හැරීම හා ඵලදායී ව භාවිත කිරීම | 3.6.1 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, විෂය නිර්දේශ සහ පෙළපොත් පිළිබඳ ව වගකීම් නිශ්චිත ව කාර්ය මණ්ඩල වෙත පවරා තිබීම හා අවශ්‍යතා හඳුනා ගෙන ඒවා සම්පූර්ණ කර ගැනීමට කටයුතු කිරීම | |
| | 3.6.2 පාසලේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, විෂය නිර්දේශ සහ පෙළපොත් ලේඛනගත කිරීම, ආරක්ෂාකාරී ව ගබඩා කිරීම, අවශ්‍ය පරිදි බෙදා හැරීමට හා ඒවා නැවත ලබා ගැනීමට කටයුතු කර තිබීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 3.7 පන්ති වාර්තා පොත් මැනවින් පවත්වා ගෙන යාම | 3.7.1 සෑම පන්තියකම පන්ති වාර්තා පොත්වල සියලු මූලික තොරතුරු සම්පූර්ණ කර තිබීම හා යාවත්කාලීන කිරීම | |
| | 3.7.2 විෂය ඉගැන්වීම් සටහන් තැබීම කාලච්ඡේද අවසානයේ ම සිදු කර තිබීම හා අඛණ්ඩව අධීක්ෂණය කර තිබීම | |
| | 3.7.3 දෛනික, සති, වාර වශයෙන් සාරාංශ සකස් කර තිබීම හා සාරාංශ විශ්ලේෂණ අනුව ප්‍රතිපෝෂණ සැපයීමට කටයුතු කර තිබීම | |
| | 3.7.4 ගුරුවරු නොපැමිණි කාලච්ඡේද සඳහා යෝජිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබීම (උදා- පැවරුම් බැංකුව ආදී) | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 3.8 ශිෂ්‍ය නිපුණතා සංවර්ධනයට අදාළ ව්‍යාපෘති සිදු කිරීම | 3.8.1 ශිෂ්‍ය නිපුණතා වර්ධනය වන පරිදි ව්‍යාපෘති සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති වාර්තා ක්‍රමවත් ව නඩත්තු කිරීම | |
| | 3.8.2 6-11 ශ්‍රේණිවල සියලු ම සිසුන් සහභාගී කරගත හැකි අයුරින් ව්‍යාපෘති සංවිධානය කර මගපෙන්වීම හා නියාමනය කිරීම | |
| | 3.8.3 අ.පො.ස (උ.පෙළ) පන්තිවල සියලු ම සිසුන් විවිධ ව්‍යාපෘති සිදු කිරීම සඳහා යෙදවීම හා ගුරුවරුන් එය නියාමනය කිරීම | |
| | 3.8.4 කාලීන අවශ්‍යතා මත හඳුන්වා දෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (උදා - ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි වැඩසටහන .............) | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| මුළු ලකුණු | | |

| ඇගයීම් කළ දර්ශක සංඛ්‍යාව | ඇගයීම් කළ දර්ශකවලට අනුව ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | ලබාගත් ලකුණු සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| | | | |

ඇගයුම්කරුගේ නම ........................................................................................ අත්සන ................................................

දිනය ...................................

# 4. විෂය සමගාමී කටයුතු

| ප්‍රමිති | අවශ්‍යතා | නිර්ණායක |
|---|---|---|
| ශිෂ්‍යයාගේ සමබර පෞරුෂය, විභව්‍යතා, අන්‍යෝන්‍ය සහයෝගීතාව, සාරධර්ම හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කළ හැකි වන පරිදි විෂය සමගාමී ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. | විෂය සමගාමී කටයුතු මනාව සැලසුම් කර ක්‍රියාත්මක කරයි. | විධිමත් විෂය සමගාමී සැලැස්මක් ක්‍රියාත්මක වීම |
| | විවිධ වැඩසටහන් තුළින් ශිෂ්‍ය විභ්‍යවතා සහ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරයි. | ප්‍රාථමික අංශයේ විෂය සමගාමී වැඩසටහන් ඵලදායී ව ක්‍රියාත්මක කිරීම. |
| | විෂය සමගාමී කටයුතු මගින් ශිෂ්‍යයින් තුළ ආචාර ධර්ම හා සාරධර්ම වර්ධනය කරයි. | සිසුන්ගේ ශාරීරික වර්ධනයට යෝග්‍ය පරිදි අවස්ථා ලබා දීම |
| | | සිසු විභ්‍යවතා, නිර්මාණශීලිභාවය හා පෞරුෂය වර්ධනය කිරීමට පියවර ගැනීම |
| | | ආචාරධර්ම හා සාරධර්ම වර්ධනය සඳහා අවධානය යොමු කිරීම. |



ඇගයීම් ආකෘතිය 04

## විෂය සමගාමී කටයුතු

පාසලේ නම............................................

ලකුණු ලබා දීම - එක් එක් දර්ශකයට අදාළ ව පවතින තත්ත්වයන් සලකා බලා පහත සඳහන් පරිමාණවලට අනුව ලකුණු පිරිනමන්න.

ලකුණු 06 - විශිෂ්ටයි | ලකුණු 03 - සාමාන්‍යයි
ලකුණු 05 - ඉතා හොඳයි | ලකුණු 02 - සංවර්ධනය විය යුතුයි
ලකුණු 04 - හොඳයි | ලකුණු 01 - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි

| නිර්ණායකය | දර්ශකය | ලකුණු |
|---|---|---|
| 4.1 විධිමත් විෂය සමගාමී සැලැස්මක් ක්‍රියාත්මක වීම | 4.1.1 විවිධ හැකියා වර්ධනය, රුචිකත්වය හා සංස්කෘතිය පිළිබඳ දැනුවත් වීමට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කර විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික සැලැස්මක් හා ලිත සකස් කර ක්‍රියාත්මක කිරීම හා නියාමනයක් සිදුවීම | |
| | 4.1.2 සියලු ම ගුරුවරුන්ට වගකීම් පවරා තිබීම හා විෂය සමගාමී කටයුතුවල යෙදෙන සිසුන් සඳහා අමතර අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 4.2 ප්‍රාථමික අංශයේ විෂය සමගාමී වැඩසටහන් ඵලදායීව ක්‍රියාත්මක කිරීම | 4.2.1 සෑම ශිෂ්‍යයෙකු පිළිබඳව ම අවධානය යොමු කර ප්‍රාථමික අංශයේ විෂය සමගාමී වැඩසටහන් සඳහා සැලැස්මක් සකස් කර තිබීම | |
| | 4.2.2 ප්‍රාථමික අංශයට අදාළ විෂය සමගාමී ක්‍රියාකාරකම් / වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නියාමනය සිදු කිරීම | |
| | 4.2.3 එක් එක් අවධියට අදාළ ශරීර සුවතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා සිසුන් රඳවා ගැනීම | |
| | 4.2.4 තුන්වන ප්‍රධාන අවධිය සඳහා වෛකල්පිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 4.3 සිසුන්ගේ ශාරීරික වර්ධනයට යෝග්‍ය පරිදි අවස්ථා ලබාදීම | 4.3.1 එක් එක් ක්‍රියාකාරකම් සඳහා සිසුන් තේරීමට ක්‍රමවත් හා විනිවිදභාවයකින් යුක්ත ක්‍රමවේදයක් පැවතීම හා සිසුන්ගේ හැකියා / කැමැත්ත අනුව විවිධ ක්‍රීඩා සඳහා සහභාගි වීමට අවස්ථා සලසා දීම | |
| | 4.3.2 තරග සඳහා ඉදිරිපත් කිරීමට පෙර සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර තිබීම හා නිසි ලෙස පුහුණු කොට තරග සඳහා සිසුන් සහභාගි කරවීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 4.4 සිසු විභව්‍යතා, නිර්මාණශීලීභාවය හා පෞරුෂ වර්ධනය කිරීමට පියවර ගැනීම | 4.4.1 තරග, සෞන්දර්යය වැඩසටහන්, ප්‍රදර්ශන, විවාද හා භාෂා වැඩමුළු පැවැත්වීම | |
| | 4.4.2 විවිධ සමිති සංගම් ක්‍රියාත්මක වීම හා නිර්මාණශීලි අවස්ථා සඳහා සිසුන් යොමු කිරීම (නිර්මාණ පුවරු, සඟරා, පුවත්පත්, නව නිපැයුම්, සමාජ සේවා වැඩසටහන්) | |
| | 4.4.3 බාලදක්ෂ, සෞඛ්‍යදාන, ප්‍රථමාධාර, පරිසර නියමු, රතු කුරුස, ශාන්ත ජෝන් ගිලන් සේවය හා ශිෂ්‍ය භට ආදි වැඩසටහන් පැවැත්වීම | |
| | 4.4.4 එක් එක් වැඩසටහන් හා විශේෂ ජයග්‍රහණ පිළිබඳ යාවත්කාලීන වූ ලිපි ගොනු සුදුසු ක්‍රම අනුව පවත්වා ගෙන යාම (වාර්තා / පුවත්පත් වාර්තා/සටහන් /ඡායා රූප / වීඩියෝ) | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |

| | | |
|---|---|---|
| 4.5 ආචාර ධර්ම හා සාරධර්ම වර්ධනය සඳහා අවධානය යොමු කිරීම | 4.5.1 ශිෂ්‍ය ආචාර ධර්ම, ආගම, සාරධර්ම, සංස්කෘතිය හා යහ පැවැත්ම පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | |
| | 4.5.2 ජාතික ඒකාග්‍රතාව ඇති වන පරිදි විවිධ වැඩසටහන්, නායකත්ව හා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| මුළු ලකුණු | | |

| ඇගයීම් කළ දර්ශක සංඛ්‍යාව | ඇගයීම් කළ දර්ශකවලට අනුව ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | ලබාගත් ලකුණු සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| | | | |

ඇගයුම්කරුගේ නම ........................................................................................ අත්සන ................................................

දිනය ....................................

# 5. ශිෂ්‍ය සුභසාධනය



### ප්‍රමිති

විවිධ සුභසාධන වැඩසටහන් තුළින් ශිෂ්‍යයන්ගේ මානසික හා ශාරීරික සංවර්ධනය ශක්තිමත් කරයි.

### අවශ්‍යතා

ඵලදායී හා කාර්යක්ෂම ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශන ක්‍රියාවලියක් පවත්වා ගනියි.

සුභසාධන සේවා මගින් ශිෂ්‍ය මූලික අවශ්‍යතා ඉටුකිරීමට කටයුතු කරයි.

ශිෂ්‍ය සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය වර්ධනය සඳහා පියවර ගනියි.

ශිෂ්‍ය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය තහවුරු කිරීමට ක්‍රියා කරයි.

### නිර්ණායක

විධිමත් ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ ක්‍රියාවලියක් පැවතීම

ශිෂ්‍ය පැමිණීම

විධිමත් හා සැලසුම් සහගත වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රියාවලියක් පවත්වා ගැනීම

සමාජ ආර්ථික ගැටලු ඇති දරුවන්ට සහන සැලසීම

සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ මට්ටම් හඳුනා ගැනීම

ශිෂ්‍ය සනීපාරක්ෂාව තහවුරු කිරීම

ළමා සුරක්ෂිතතාව තහවුරු කිරීම

ආපනශාලාව මැනවින් පවත්වා ගෙන යාම

ආපදා කළමනාකරණය විධිමත් ව සිදු කිරීම

ඇගයීම් ආකෘතිය 05

## ශිෂ්‍ය සුභසාධනය

පාසලේ නම..............................................................

ලකුණු ලබා දීම - එක් එක් දර්ශකයට අදාළ ව පවතින තත්ත්වයන් සලකා බලා පහත සඳහන් පරිමාණවලට අනුව ලකුණු පිරිනමන්න

| | | | |
|---|---|---|---|
| ලකුණු 06 - විශිෂ්ටයි | | ලකුණු 03 - සාමාන්‍යයි | |
| ලකුණු 05 - ඉතා හොඳයි | | ලකුණු 02 - සංවර්ධනය විය යුතුයි | |
| ලකුණු 04 - හොඳයි | | ලකුණු 01 - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි | |

| නිර්ණායකය | දර්ශකය | ලකුණු |
|---|---|---|
| 5.1 විධිමත් ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ ක්‍රියාවලියක් පැවතීම | 5.1.1 ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ වැඩසටහන් පිළිබඳ වගකීම් පවරා තිබීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මේ පිළිබඳව පාසල් ප්‍රජාව දැනුවත් කිරීම | |
| | 5.1.2 සිසුන්ගේ ගැටලු හඳුනාගැනීමට පැහැදිලි ක්‍රමවේදයක් තිබීම හා එම ගැටලු සාකච්ඡා කිරීම සඳහා සුදුසු ස්ථානයක් සකසා තිබීම | |
| | 5.1.3 උපදේශකවරයා වෙත යොමු වූ ගැටලු සම්බන්ධයෙන් ආචාර ධර්මවලට අනුකූල ව සුදුසු ක්‍රියාමාර්ග ගෙන තිබීම හා වාර්තා පවත්වාගෙන යාම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 5.2 ශිෂ්‍ය පැමිණීම | 5.2.1 ශිෂ්‍යයින්ගේ ප්‍රමාද වී පැමිණීම් පිළිබඳ හේතු හඳුනා ගැනීම, දෛනිකව ප්‍රමාදවන සිසුන් පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම හා ප්‍රමාද වීම් වැළැක්වීම සඳහා කටයුතු කිරීම | |
| | 5.2.2 සෑම සිසුවකුම පාසලට යන එන ගමනාගමන ක්‍රමය පිළිබඳ පාසල දැනුවත්ව සිටීම හා සිසුන්ට පාසලට පැමිණීමේ දී හා යාමේ දී ඇතිවන ගැටලු, ආපදා සම්බන්ධව වාර්තා වුවහොත් ඒ පිළිබඳ මැදිහත්වීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 5.3 විධිමත් හා සැලසුම් සහගත වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රියාවලියක් පවත්වා ගැනීම | 5.3.1 වෘත්තීය පුහුණු පාඨමාලා හා මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම, පවත්වා ගැනීම හා අවශ්‍ය අවස්ථාවල සම්පත් පුද්ගල සහාය ලබා ගැනීමට කටයුතු කර තිබීම | |
| | 5.3.2 ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ළැදියාවන් හා කුසලතා හඳුනා ගැනීම, පාසල් හැර යන සිසුන් හා දෙමවුපියන් වෘත්තීය පාඨමාලා පිළිබඳ දැනුවත් කිරීම හා සිසුන් ඒ සඳහා යොමු කිරීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
| 5.4 සමාජ ආර්ථික ගැටලු ඇති දරුවන්ට සහන සැලසීම | 5.4.1 සමාජ ආර්ථික ගැටලුවලට මුහුණ පා සිටින දරුවන් පන්ති මට්ටමින් හඳුනා ගැනීම හා එවැනි සිසුන්ට සහන සැලසීම සඳහා පාසල් මට්ටමෙන් සුදුසු වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කර තිබීම | |
| | 5.4.2 ආධාර කළ හැකි පරිත්‍යාගශීලීන්ගේ සහාය ලබා ගැනීම හා ලැබෙන ආධාර විනිවිදභාවයෙන් යුක්තව බෙදා හැරීමේ වැඩපිළිවෙළක් තිබීම | |
| | නිර්ණායකයට අදාළ මුළු ලකුණු | |
